**ප්‍රාදේශිය සංවර්ධන සහායක ව්‍යාපෘතිය - 2022**

**-----------------------------------------------------**

ප්‍රදේශිය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2019 මැයි 14 දින එළඹි අංක 6371 - එල්කේ දරන ණය ගිවිසුමේ උපලේඛන 01 හි 4.2 ව්‍යාස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 04 හි පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ප්‍රජාවන්ට ප්‍රතිචාරාත්මකව හා වගවීමකින් යුතුව සේවා සැපයීම සඳහා පළාත් පාලන ආයතනවල හැකියාවන් ශක්තිමත් කිරීම සහ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සහභාගී වන පළාත්වලට සහය වීම වේ. ණය සහ ප්‍රදාන ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 17,665.63කට සමාන එජඩො මිලියන 100.65ක් වන අතර ඉන් රු.මිලියන 12,222.41කට සමාන එජඩො මිලියන 70ක් මූල්‍යායනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සමායතනය එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 4,220.98කට සමාන එජඩො මිලියන 23.65ක් මූල්‍යායනය කිරීම යුරෝපා සංගමය එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 ජුනි 30 දින ආරම්භ කර තිබුණු අතර 2022 දෙසැම්බර් 30 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 නීති, රීති රෙගුලාසි සමග අනුකූල නොවීම**

| අංකය | නීති, රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.3.3 (ඇ) වගන්තිය | රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරියෙකු ඔහුගේ /ඇයගේ අදාළ තනතුරේ සේවය කරන අතරතුර වැඩ බැලීමේ පදනම මත ව්‍යාපෘතියක සේවය කිරීමට මුදාහැරිය හැකිය. කෙසේවෙතත්, චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට පටහැනිව, උතුරු මැද සහ ඌව පළාත් පාලන ආයතනවල කොමසාරිස්වරු නියෝජ්‍ය අධ්‍යක්ෂකවරු ලෙස පත්කර තිබුණු අතර එකතුව රු.963,000ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. | අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට පටහැනිව ප්‍රධාන ලේකම් කටයුතු කර ඇත්ද යන්න සොයා බැලීමට ව්‍යාපෘති අධ්‍යක්ෂක උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව ගෙවා ඇති වැටුප් නැවත අයකර ගැනීමට අනුව පියවර ගත යුතුය. |
| (ආ) | 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 වගන්තිය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් මාස 02 කට වරක් පැවැත්වීමට අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් 03ක් පමණක් පවත්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්වීමට අවශ්‍ය වේ. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| රුපියල් මිලියන 1,614කට ඇස්තමේන්තු කර තිබූ පළාත් හතරක උප ව්‍යාපෘති 80ක් 2022 දෙසැම්බර් 31 වන විට අවසන් කළ යුතුව තිබුණද, එහි භෞතික ප්‍රගතිය සියයට 20ත් සියයට 95ත් අතර විය. | අදහස් දක්වා නොමැත. | අවශ්‍ය ගුණාත්මක මට්ටම සහතික කරමින් සිවිල් වැඩ කඩිනමින් නිම කර ගැනීමට ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුව පෙළඹවිය යුතුය. |

### 3.2 අසම්පූර්ණ උපදේශක කටයුතු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| උතුරු සහ නැගෙනහිර පළාත්වල ධාරිතා වර්ධනය, අධීක්ෂණය හා ඇගයීම, ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය සහ ඌව සහ උතුරු මැද පළාත්වල ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන කටයුතු 2020 ජනවාරි 10 දින හෝ ඊට පෙර නිම කිරීමට උපදේශකවරු 04 දෙනෙකු පත්කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී රුපියල් මිලියන 3.7ක ගෙවීමෙන් කොටසක් සිදුකර තිබුණි. කෙසේවෙතත්, නියමිත කාලය තුළ නිම නොකරන ලද ඉහත සඳහන් උපදේශන කටයුතු තුළින් කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. | සම්පූර්ණ නොකළ වැඩ සිදුකර ඇත. | ගෙවූ මුදල් නැවත අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මතභේදයට තුඩු දෙන කරුණු / ව්‍යාපෘති අරමුණුවලට පටහැනි ගෙවීම්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ කටයුතු ආරම්භවීමට පෙර ව්‍යාපෘති සූදානම් කිරීමේ කටයුතු නිමකිරීමට පත්කරන ලද තාක්ෂණික ප්‍රසම්පාදන, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, පළාත් පාලන සහභාගිත්ව සංවර්ධන සැලැස්ම සඳහා පහසුකම් සපයන්නා සහ පාරිසරික සහ සමාජ ආරක්ෂණ සඳහා පත් කරන ලද තනි පුද්ගල උපදේශකවරු හතර දෙනා සඳහා රු. මිලියන 6.47ක කොටස් ගෙවීමක් කර තිබුණි. කෙසේවෙතත්, නියමිත කාලය තුළදී ඉහත සඳහන් උපදේශන කටයුතු නිමනොකිරීම හේතුවෙන් ඉහත වියදම නිශ්කාර්යය වියදමක් ලෙස බවට පත්වී තිබුණි. එසේ තිබියදීත් කාර්යභාරය නිම කිරීමකින් තොරව ඉතිරි මුදල ගෙවීමට 2022 පෙබරවාරි 23දින තීරණයක් ගෙන තිබුණි. | අදහස් දක්වා නොමැත. | ගෙවූ මුදල් නැවත අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දින දක්වා උතුරු මැද පළාත, උතුරු පළාත සහ අදාළ පළාත් පාලන ආයතන විසින් LAPDP සකස් කිරීම සඳහා රුපියල් මිලියන 4.93 ක මුළු මුදලක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, අදාළ පළාත් පාලන ආයතන විසින් LAPDP සකස් කිරීමේදී ඉහළම ප්‍රමුඛතා සහිත උපව්‍යාපෘති තෝරා ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් නිෂ්ක්‍රීය වියදමක් ලෙස නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | ණය ගිවිසුමේ මගපෙන්වීම අනුව උප ව්‍යාපෘති තෝරාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් පාලන ආයතන සඳහා මුදල් නිදහස් කිරීමේදී ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි 2.9 හි සඳහන් ව්‍යාපෘති වලට මුදල් නිදහස් නොකල යුතු බව දැක්වේ. එසේ වුවද 2022 දෙසැම්බර් 31 දින වන විට පළාත් 4 තුල එකතු වටිනාකම රුපියල් මිලියන 105 ක මුදලක් එසේ බැහැර කළ යුතු ව්‍යාපෘති 58 ක් වෙනුවෙන් නිදහස් කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි විධිවිධාන අනුව ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | ප්‍රතිචාරාත්මක සහ වගකීම් සහගත ලෙස ප්‍රජාවන්ට සේවා සැපයීමට සහ සහභාගීවන පළාත්වල ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනයට සහාය වීමට, පළාත් පාලන ආයතනවල හැකියාවන් ශක්තිමත් කිරීම ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ අරමුණ වන අතර ණය ගිවිසුම ප්‍රකාරව මූලික සහ කාර්යසාධන ප්‍රදානයන් ලබාදෙනු ලබන්නේ පළාත් පාලන ආයතන සඳහා පමණි. නමුත් ණය ගිවිසුමේ විධිවිධානවලට පටහැනිව ඌව පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත මූලික ප්‍රදානයන් සහ කාර්යසාධන ප්‍රදානයන් ලෙස රුපියල් මිලියන 118ක් අත්තිකාරම් වශයෙන් ලබා දී තිබූ බවත් 2022 දෙසැම්බර් 31 දිනට ඉන් රුපියල් මිලියන 13ක් වියදම් කර තිබූ බවත් විගණනයේදී නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි විධිවිධාන අනුව ක්‍රියා කළ යුතුය. |

### 3.4 පද්ධති හා පාලනයන්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ණය ගිවිසුමේ 02 උපලේඛනයේ (ඇ) වගන්තිය අනුව, පළාත් සභා 04 සමග ගිවිසුම් අත්සන් කිරීමට පියවර ගෙන තිබුණි. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කිරීමෙන් පසුව පළාත් සභා සමග ගිවිසුම් අත්සන් කරනු ලැබේ. | ගිවිසුම් අත්සන් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | ණය ගිවිසුමේ 02 උපලේඛනයේ (ඉ) වගන්තිය අනුව, 2022 වර්ෂය සඳහා වාර්ෂික අයවැය සහ වැඩ සැලැස්ම සඳහා මෙහෙයුම් කමිටුවෙන් අනුමැතිය ලබාගත් බව තහවුරු කරගැනීමට සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වැඩ සැලැස්ම සහ අයවැය මෙහෙයුම් කමිටුවට ඉදිරිපත් කර තිබුණි. | අයවැය සහ වැඩ සැලැස්ම පිළියෙල කර මෙහෙයුම් කමිටුවෙන් අනුමැතිය ලබා ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර දරන ලද රු.මිලියන 1.7ක වියදම ව්‍යාපෘති වියදම යටතේ ගිණුම්ගත කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | මෙම වියදම් ව්‍යාපෘතියට සම්බන්ධ බවට තහවුරු කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |